# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

2016.09.06

ගරු අග්‍රාමාත්‍ය තුමා,

අග්‍රාමාත්‍ය කාර්යාලය,

නො. 58, ද අර්නර්ස්ට් ද සිල්වා මාවත,

කොළඹ 07

ගරු අග්‍රාමාත්‍ය තුමනි,

## අපේක්ෂක වියදම් සීමා කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම

මැතිවරණවලදී අපේක්ෂකයන් කරනු ලබන අසීමිත වියදම් සීමා කළයුතු බවට ඔබ තුමන් විසින් පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයට අපගේ ප්‍රසාදය පළකරමු. අග්‍රාමාත්‍ය වරයා ලෙසත්, එක්සත් ජාතික පක්ෂයේ නායකයා ලෙසත් ඔබ තුමන් ඒ සම්බන්ධයෙන් දරන උනන්දුව අප බෙහෙවින් අගය කරන අතර ඉදිරි පළාත් පාලන මැතිවරණයට පෙර එය යථාර්තයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනයට ඔබ තුමන් ක්‍රියාකරනු ඇතැයි අප විශ්වාස කරමු.

එමෙන්ම ඉදිරි මැතිවරණය කොට්ඨාස ක්‍රමය මත පදනම් වන බැවින් එකී මැතිවරණයට පෙරාතුව අපේක්ෂකයන් මැතිවරණ ප්‍රචාරණය සඳහා කරනු ලබන වියදම් සීමා නොකළහොත් එය සැබෑ ජනමතයට ප්‍රබල බලපෑමක් එල්ල කරනු ඇත.

01. පසුගිය පළාත් පාලන මැතිවරණවලදී සමහර අපේක්ෂකයන් මුළු පළාත් පාලන බලප්‍රදේශය සඳහා වියදම් කළ මිලියන ගණනක මුදල් ග්‍රාම සේවා වසමක් හෝ දෙකක් ඇතුලත පිහිටි කොට්ඨාසයකට වියදම් කළ හොත් එය ඡන්ද දායකයන් මිලදී ගැනීම වැනි බරපතල තත්ත්වයක් ඇති කරනු ඇත.

02. අපේක්ෂක ප්‍රචාරක/ ප්‍රවර්ධන වියදම් සීමා නොකළහොත් මහජන සේවයට කැපවීමක් දක්ෂතාවයක් සහිත එහෙත් මැතිවරණ සඳහා මුදල් වියදම් කිරීමට නොහැකි සැබෑ මහජන නියෝජිතයන් දේශපාලනයෙන් ඉවත්ව යනු ඇත.

03. අපේක්ෂක ප්‍රචාරක / ප්‍රවර්ධන වියදම් සීමා නොකළහොත් අයථා ක්‍රම මගින් මුදල් උපයාගත් දූෂිත පුද්ගලයන් තම රැකවරණය සඳහාත්, බලය සඳහාත් දේශපාලනයට පැමිණෙනු ඇත. ඒ හරහා තම අයථා ව්‍යාපාර පහසුවෙන් පවත්වාගෙන යනු ඇත.

04. අපේකෂක ප්‍රචාරක/ ප්‍රවර්ධන වියදම් සීමා නොකළහොත් යහපත් අපේක්ෂකයන්ට පවා ජයග්‍රහණ සඳහා තම මුදල් අසීමිතව වියදම් කිරීමට හෝ ව්‍යාපාරිකයින් ගෙන් මුදල් ලබා ගැනීම සිදුවනු ඇත. එවැනි තත්ත්වයක් යටතේ ඔවුනට තම ජයග්‍රහණයෙන් පසු තමා වියදම් කළ විශාල මුදල උපයා ගැනීමට ක්‍රියාකරනු ඇත. නො එසේ නම් මුදල් ලබාදුන් පිරිසට එම මුදල උපයා ගැනීම සඳහා අවස්ථාව ලබාදීමට හෝ සිදුවනු ඇත.

05. අපේක්ෂක ප්‍රචාරක / ප්‍රවර්ධන වියදම් සීමා නොකළහොත් ගම තුළ අධික තරගකාරීත්වයක් සහිත ප්‍රචාරක ව්‍යාපාර ක්‍රියාත්මක වනු ඇත. එමගින් අනවශ්‍ය ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය විය හැක.

**# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.**
**Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443**
**E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk**

06. අපේක්ෂක ප්‍රචාරක/ ප්‍රවර්ධන වියදම් සීමා කිරීම හරහා තරුණ හා කාන්තා නියෝජනය වැඩිවිය හැකි අතරම වියදම සීමා කිරීම මගින් මැතිවරණ කාලසීමාවලදී පරිසරයට වියහැකි හානිය ද අවම වනු ඇත.

එළඹෙන පළාත් පාලන මැතිවරණයට පෙරාතුව අපේක්ෂක වියදම් සීමා කිරීම සඳහා කටයුතු නොකළහොත් පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමෙන් අපේක්ෂා කළ දක්ෂ, හැකියාවන් සහිත සැබෑ ග්‍රාමීය නායකයන්ට පළාත් පාලන ආයතනවල නියෝජිතයන් වීමට ඉඩකඩ නොලැබෙනු ඇත. එමෙන්ම එය ප්‍රජාතන්ත්‍රවාදී රාමුව ලෙස ප්‍රජාතන්ත්‍රවාදයේ විකෘති වීමක් ද විය හැකිය.

අපේක්ෂක වියදම් සීමා කිරීම කලාපයේ බොහෝ රටවල සාර්ථකව සිදුකර ඇති අතර අපේක්ෂක වියදම ඡන්ද දායක ප්‍රමාණයට අනුපාතිකව සිදුකර ඇත.

අප ඔබ තුමන්ගෙන් ඉල්ලා සිටින්නේ නව දේශපාලන සංස්කෘතියක් ඇති කරමින් ඉදිරි පළාත් පලාන මැතිවරණයට පෙර අපේක්ෂක වියදම් සීමා කිරීම සඳහා නව නීති සම්පාදනය කිරීමට ක්‍රියාකරන ලෙසයි.

ස්තූතියි.

මෙයට විශ්වාසී.

රෝහණ හෙට්ටිආරච්චි.

විධායක අධ්‍යක්ෂ.

පිටපත - සභාපති, මැතිවරණ කොමිසම

උනන්දුවක් දක්වන සෙසු ආයතන